# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

**PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS**


2017.08.31

ප්‍රවෘත්ති කර්තෘ/සංස්කාරක,

***ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වීමේ අවසන් අවස්ථාවෙන් ප්‍රයෝජනය ගනිමු.***

2017 ඡන්දහිමි නාම ලේඛන ප්‍රතිශෝධනයට අදාලව සකස් කරන ලද ඡන්ද හිමි ලියාපදිංචි විස්තර කෙටුම්පත මැතිවරණ දෙපාර්තමේන්තුවේ (www.slelections.gov.lk) වෙබ් අඩවියට පිවිසීමෙන් දැන් ඔබට පරීක්ෂා කල හැකිය.

එසේ පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඔබගේ නම ඇතුලත්ව් නොමැති නම් හෝ අදාල නොවන වෙනත් කොටස් නමට ඇතුලත්ව් ඇත්නම් තහවුරු කල හැකි ලේඛන වල පිටපත්ද සහිතව අදාල දිස්ත්‍රික්කයේ මැතිවරණ කාර්යාලය වෙත යොමු කිරීමෙන් එම අඩුපාඩුව නිවැරදි කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

යම් කිසි හේතුවක් නිසා මෙතෙක් ඡන්ද හිමියන් ගනන් ගැනීමේ ආකෘති පත්‍රය (BC Form) සම්පූර්ණ කර භාරදීමට නොහැකි වුයේ නම් 2017 සැප්තැම්බර් 06 දක්වා කාලය තුල සම්පූර්ණ කරන ලද හිමිකම් ඉල්ලුම් පත්‍රයක් අදාල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට භාරදීමට කටයුතු කරන්න.

අදාල පෝරම ග්‍රාම නිලධාරී කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වලින් ලබාගත හැක. ඡන්ද හිමි ඔබගේ නම ඇතුලත් කර ගැනීමට ලැබෙන අවසන් අවස්ථාව මෙය බැවින් වහාම ක්‍රියාත්මක වන්න.

පළාත් පාලන මැතිවරණය හා පළාත් සභා මැතිවරණ කිපයක්ම මෙම වසර අග හෝ ලබන වසර මුල පැවැත්වීමට නියමිත ඇති අතර එම ඡන්ද විමසීම් සඳහා ප්‍රයෝජනයට ගනු ලබන්නේ 2017 වසරට අදාල ඡන්ද හිමි නාම ලේඛනය වන බැවින් ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වූ බවට නිසැක වීම පුරවැසි ඔබගේද වගකීමකි.

සුදුසුකම් සහිත සියල්ලන් ඇතුලත් ඡන්ද හිමි නාම ලේඛනය සකස් කිරීම මැතිවරණ දෙපාර්තමේන්තුවට පමණක් අයත් කාර්යක් නොවන බව තරයේ විශ්වාස කරන අප ඒ සඳහා ක්‍රියාකාරී සහයෝගය ලබාදීම දේශපාලන පක්ෂ වල මෙන්ම පුරවැසි ඔබගේද යුතුකමක් මෙන්ම වගකීමක් බව අවධාරණය කරමු.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ජනතා පරමාධිපත්‍ය, ඡන්ද බලය හරහා ක්‍රියාත්මක කිරීමට ලැබෙන මෙම මහඟු අවස්ථාවෙන් ප්‍රයෝජනය ගැනීම සඳහා ඔබ අනිවාර්යයෙන්ම ඡන්දහිමියෙකු ලෙස ලියාපදිංචි විය යුතු අතර ඡන්දයක් ආසන්නයේ හෝ වෙනත් අවශ්‍ය අවස්ථාවලදී ඡන්ද හිමිනාම ලේඛනයේ ඔබේ නම නොමැති බවට මැසිවිලි නැගීමෙන් කිසිදු පලක් නොවන බව අවධාරණය කිරීමට කැමැත්තෙමු.

මෙයට,

විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යක්ෂක


# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.

Tel: (+94) 11 2514441 / 11 2514442 Fax: (+94) 11 2514443

E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk


Scanned by CamScanner